
# මට දැනෙනා ගීයේ රස



මිනුති විචාරා බෝධිකොටුව

# මට දැනෙනා ගීයේ රස

මිනුති විචාරා බෝධිකොටුව

කර්තෘ ප්‍රකාශනයකි.

ප්‍රථම මුද්‍රණය 2023 දෙසැම්බර්

ගී විමසුම සහ පිටකවර සිතුවම

**මිනුති විචාරා බෝධිකොටුව**

6 ශ්‍රේණිය

මහාමායා බාලිකා විද්‍යාලය

ISBN – 978-624-208-090-1

# පිදුම

කලා රසය නිබඳවම මා හට ලබාදෙන

ආදරණීය අප්පච්චිටත්....

මහාමායාවේදී මට මුල්ගුරු වූ

ලිවීමේ කලාවට මා යොමුකරන

සෙනෙහෙවන්ත වූ සමන්මලී ගුරුතුමියටත්....

සිප් සතර දෙමින් නිසි මග පෙන්වන

ගුරුවරුන් සැමට හා

මහාමායා යෙහෙළියන්ටත්

සෙනෙහසින් ......

*මිනුති විචාරා බෝධිකොටුව*

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්"ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.11

# පටුන


| | |
|---|---|
| නොසිඳෙන සෙනෙහස | 01 |
| පිය සෙනෙහස | 04 |
| උපන් බිමට වැඩිය තැනක් | 06 |
| වැව් බැඳි රටක සිරිය | 08 |
| පුංචි බොරුවක් | 10 |
| සතුන්ගේ දරු සෙනෙහස | 12 |

# නොසිඳෙන සෙනෙහස......



**මිහි මඬලේ අඳුරු කුසේ දිය උල්පත අම්මා**
**අහස් තලෙන් මරු කතරට වහින වැස්ස අම්මා**
**නිල් දෙරණේ තුරුලිය මත මල් සම්පත අම්මා**
**තුරුලිය මත පිපි කුසුමේ එල සම්පත අම්මා**

**සිය දහසක් නෙක ලෝ දා එළිය කරන අම්මා**
**සොළොස් කලා පිරි පුර හඳ එළිය කරන අම්මා**

**සඳ නැති රෑ සක්වල තරු එළිය කරන අම්මා**
**උදාගිරෙන් ලොවට වඩින ළහිරු මඬල අම්මා**

ගේය පද : ඩබ්ලිව්. ඒ අබේසිංහ

තනුව හා ගායනය : විශාරද නන්දා මාලනී

ඩබ්ලිව්.ඒ. අබේසිංහ අපේ රටේ උගත් නීතිඥවරයෙක් වගේම කවියෙක්. දිනක් ඔහුගේ පර්යේෂණයක් සඳහා ඉතා දිළිඳු මිනිසුන් වාසය කරන දුෂ්කර ගම් පළාතකට යන්න සිදුවුණා. එතුමන්ට දැඩි පිපාසයක් දැනෙනවා. ඔහු නිවසකට ගොඩ වදිනවා. මහළු අත්තම්මා කෙනෙක් දොරකඩට විත් "පුතේ උඹට මොනවද ඕනේ?" කියලා ඇහුවා. "මට බොන්න වතුර ටිකක් දෙන්න පුළුවන්ද?" ඔහු උත්තර දුන්නා. ඒ අත්තම්මා මෙහෙම කිව්වා.

"පුතේ ඔය දිය කඩිත්තෙන් වතුර ටිකක් බීපන්" කියලා පොල් කටුවක් අතට දුන්නා. මේ වතුර බොන්නට හැකිදැයි ඔහුගේ හිත තුළ සැකයක් පහළ වුණා. "මේ වතුර බොනවද අම්මේ?" ඔහු විශ්මයෙන් වගේ ඇහුවා.

"අනේ බය නැතුව බීපං පුතේ ඔය වතුර ටික අම්මා වගේ..." අත්තම්මා පිළිතුරු දුන්නා.

පිපාසය නිවාගත් ඔහු නැවත ගමන ආරම්භ කළා.

අත්තම්මා කියපු කතාව ඔහුගේ හිතේ තදින්ම පැලපදියම් වුණා.

පුංචි කොල කැබැල්ලක් අතට ගත් ඔහු මෙහෙම ලියනවා.

මිහි මඩලේ අඳුරු කුසේ දිය උල්පත අම්මා .....

ඇත්තටම නන්දා මාලනියන් ගයන මේ ගීය ඇහෙන වෙලාවෙදි මට අම්මා ගැන පුදුමාකාර ආදරයක් දැනෙනවා.

ආදරණීය අම්මා ගැන ඩබ්ලිව්.ඒ. අබේසිංහයන් ගේ ඒ සින්දුව මොන තරම් අගේද?

අම්මා තරම් පිරිසිදු වස්තුවක් මේ ලෝකෙ තවත් තියෙයිද? ඒ නිසයි අත්තම්මා අර දියකඩිත්තට අම්මාව උපමා කරන්නට ඇත්තේ. ඒ තරමටම විශ්වාසනීයයි ඒ දිය කඩිත්ත.

දිය උල්පත, වහින වැස්ස, මල් සම්පත, ඵල සම්පත බඳු පරිසරයේ ඇති මෙවැනි සංකේත මව් ගුණයේ ඇති වටිනාකම දනවන්න ඔහු මේ ගීතය සඳහා යොදන්න ඇති කියා මට හිතෙනවා. ඔබත් අහලම විඳගන්න මේ හැම පද පේලියකම ඔයාගෙ අම්මාව දකින්න පුලුවන් වේවිද කියලා




මිදුලේ වැලි මාලිගාවෙ සක්විති පදවිය ලබන්න
ගල්වැට ලඟ වාඩි වෙලා සඳ පායන හැටි බලන්න
සතර දිසා ජයගෙන මම හනික එමී
ඔබේ ලොවට සඳ හිරු වී එළිය දෙමී//

පීනා සිප් සයුර දෙතෙර
සියල් සතර දැන පිරිසිඳ
ලොවේ අනෙක අවමන් මැද නොසෙල්වෙමි...
මිනිස් මහිම දෝතින් ගෙන සිනාසෙමී...

එපා ඔටුණු මගේ සිරසට
එපා සිහසුනක් හිඳිනට
සිනා සිසී මා එන මග හිඳිනු මැනේ
දුවේ කියා මා අමතන් පියාණනේ

ගේය පද : කරුණාදාස සපුතන්ත්‍රි
තනුව : ආචාර්ය රෝහණ වීරසිංහ
ගායනය : පේෂලා මෙන්ඩිස්

අපි දැන් මේ ඉන්න ගෙදරට කලින් අපි පදිංචිවෙලා හිටියෙ බොහෝම ලස්සන තැනක. උස් තැනක පිහිටා තිබුණු නිවසට උඩින් විශාල ගල් තලාවක් තියෙනවා. සමහරක් වෙලාවට මගේ අප්පච්චි ඒ ගල්තලාව උඩට මාවත් එක්ක ගිහින් ඈත අහසේ හඳ තරු පෙන්නමින් ලස්සන කතා කියාදෙමින් මාව සතුටු කළ විදිය මට මතකයි. ගහ කොළ, පරිසරය, සත්තු ගැන බොහෝ දේවල් අප්පච්චියි මායි කතා කරනවා.

ඒක නිසා මම පරිසරයේ ඇති හැමදේම රස විඳගන්න පුරුදු වුණා.

දවසක ඒ වෙනුවෙන් පුංචි අපිට ඒ ණය ගෙවන්න වෙනවා. ඒක අපේ යුතුකම.

හොඳින් ඉගෙනගෙන අප්පච්චිගේ හිතේ බලාපොරොත්තු ඉෂ්ටවෙන දවසට ඔහු මොන තරම් සතුටක් ලබයි ද?

අප්පච්චිගේ හිතේ තිබෙන්නෙ මාව රජෙක් කරන්න කියලා මම දන්නවා.

ඒත් අප්පච්චි ඒ සියල්ලටම වඩා මට ඔයා දුන්න ආදරය ගොඩක් වටිනවා. ඒ නිසා මම ඔබට ණයගැතියි.

මිදුලේ වැලි මාළිගාව  ගීතය අහනකොට මම මගේ අප්පච්චිට තවත් ආදරෙන් ළං වෙනවා.




සරුංගලේ වරල් සැලේ නිසංසලේ ගුවන් තලේ
අපෙන් මිදී වෙන රටකට යන්න හදන්නේ
උපන් බිමට වැඩිය තැනක් කොහෙද තියෙන්නේ

සරුංගලේ බට පතුරින් නුඹ සැදුවේ අපේ ළමයි
සරුංගලේ ලාටු උලා රැළි කෙරුවේ අපේ ළමයි
සරුංගලේ කොළ අලවා හැඩ කෙරුවේ අපේ ළමයි
සරුංගලේ නුඹ අහසේ අපේ ළමයි තාම බිමයි

සරුංගලේ නුඹ වෙනුවෙන් ගුටි කෑවේ අපේ ළමයි
සරුංගලේ නූල් යොදා උඩ ඇරියෙත් අපේ ළමයි
සරුංගලේ උඩ ගිය දා මතක නැතේ අපේ ළමයි
සරුංගලේ නුඹ වාගෙයි රට හැර යන අපේ ළමයි

ගේය පද : මහාචාර්ය සුනිල් ආරියරත්න

තනුව හා ගායනය : විශාරද නන්දා මාලනී

දවසක් පන්ති ගිහින් අම්මත් මමත් එන විට මගේ නිවසට යන පාරේ මහවැලි ගං ඉවුර අසබඩ මගේ වයසේම මිතුරන් කීපදෙනෙක් සරුංගල් උඩ යවමින් විනෝද වෙනවා. ටිකක් නතර වෙලා මමත් බලන් හිටියා ඒ දිහාව. ලස්සනට කොල අලවලා තිබූ සරුංගලය ඈත අහසේ උඩ පාවෙමින් තිබුණා බලන්න ආසයි.

එකපාරටම එක සරුංගලයක් එහාට මෙහාට ගැස්සෙමින් ඈතට ඈතට යනවා මම දැක්කා. නූලෙන් ගිලිහුණු සරුංගලය ඈත අහසේ දුරකට නොපෙනී ගොස් සැඟවුණා. අනේ ... අපි කොහොමද ඒ සරුංගලය ආය අල්ලගන්නේ, මිතුරන් ටිකත් හරිම දුකෙන් ඒ දෙස බලාගෙන හිටියා.

නන්දා මාලනියන් ගායනා කරන මේ ගීතය මගේ මතකයට ආවා. අපේ මව්බිමෙන් අධ්‍යාපනය ලබාගෙන වෙනත් රට ගොස් රැකියාවල් කරන අපේ දරුවෝ ඉන්නවා. දුර රටකට ගිහිල්ලා තමන්ගේ අයවත්, ඉපදුන මව්බිමත් අමතක කරන්නේ කොහොමද? මේ ගීතය පුරාවට කියන්නේ ඒ කතාවයි. ඔයාලටත් හිතට දැනෙයි යමක්, අපිත් ඉපදුනු මව්බිමට වැඩක් කිරීමට හිතට ගන්න වෙනවා. එහෙම උනොත් තමා තමන්ගෙ යුතුකම ඉටුකලා වෙන්නේ...

## වැව් බැඳි රටක සිරිය.....

කහවන් ගොයමට රන් දිය වැහැලා
නියරින් ඉතිරෙනවා
ගස්වල හෙවණැලි වැඩියෙන් කළු වී
මිහිමත වැතිරෙනවා
විහඟ වලා ගුවන වෙලා//
දුර අහසේ නොපෙනී යනවා//
කවියක් ගීයට හැරුණ කලක්දෝ//
ඉපනැලි නළියනවා//

මින්නේරිය වැව දැන් නිල් කැටයකි
තැන තැන රඟ දෙනවා
එක දෙක දිය රැළි සුළඟට කැඩි කැඩී
සුදු ඉරි මතු වෙනවා
මුතු අමුණා ගී මුමුණා...//
දුර වෙරළට රැළි ඇද්දෙනවා//
මින්නේරිය වැව පට සළු ඇඳගෙන
ඔන්චිලි පැද්දෙනවා//

මහසෙන් රජ වැඳ නින්දට යන්නට
පෙරයම සැරසෙනවා
අවුරුදු දහසක් කෙත්බිම් සරු කොට
හිනැහී සැනසෙනවා
යල වපුරා මහ වපුරා//
ගොයමට දියරැළි නංවනවා ...//
මින්නේරිය වැව හෙට හී කවියෙන්
උදයට ළංවෙනවා//

ගේය පද : ගරු මර්සලිනු ජයකොඩි පියතුමා

තනුව : පී. ඩන්ස්ටන් ද සිල්වා

ගායනය : විශාරද නාලනී රණසිංහ

ශ්‍රී ලංකාව මොන තරම් සුන්දර රටක්ද? ගංගා දිය ඇළි වගේම විශාල වැව් වෙහෙර විහාර සරුසාර කෙත්වතුවලින් අලංකාර වූ පින් බිමකි.

එක් නිවාඩු කාලයක අපි ලොකු අම්මලා සමග පොළොන්නරුව චාරිකාවක් යොදා ගත්තා. යන අතරතුර හමුවන මින්නේරි වැව ළඟ ගිමන් නිවන්න අපි මද වේලාවක් වාහනෙන් බිට බැස්සා. වැව් සිරිය නරඹන ගමන් මගේ අප්පච්චි මගේ ළඟට ඇවිත් කිව්වා මින්නේරි වැව හැදුව ධාතුසේන රජු ගැනත්  ඔහු මින්නේරි දෙවියන් නමින් ප්‍රචලිත බවත් කීවා. ඔහු සීගිරිය නිර්මාණය කල කාශ්‍යප රජුගේ පියාණන් බවත් කිව්වා.

රන්වන් පාටින් ලෙළදෙන කුඹුරු යාය පිසගෙන එන සුළං රැල්ල පුදුම සුවයක් ගෙනෙනවා. ඒ වගේම ලස්සන සිතුවමක්  මවනවා.

ඉතිං මේ සුන්දර සිතුවම ගීයකට හැරවුනේ ගරු මර්සලිනු ජයකොඩි පියතුමන් අතින්, නාලනී රණසිංහයන් ගයන මේ මේ ගීතය ඉතා මිහිරි ගීතයක්.

රන්වන් පාටින් වැටුන හිරු රැස් හා ජල කඳ හා මුසුව කෙත් යාය පුරා විසිර ගොස් ඉතිරී යන ආකාරයත්, වෙල් ඉපනැල්ල සුළඟට ලෙළදෙන අතර, වැව් පරිසරයේ චමත්කාරයත්, සරුසාර කෙත් යායේ අපූරුවත් මෙම ගීතයෙන් අපට මැවී පෙනේ.

## පුංචි බොරුවක්...

**මලක් නෙලා ගෙනැවිත් බුදු සාදුට පිදුවා**
**ඒ දැක බුදු සාදු මදෙස හෙම්හිට බැලුවා**
**බොරුවක් නොව මේ කියන්නේ ඇත්තම ඇත්තයි**
**මේ මල මම නෙලා ගත්තේ මගේ මල් වත්තෙන්**



**නොදැනෙන නොහැගෙන හින්දයි මේ විමසන්නේ**
**ඉතින් තවම ඇයි ඔබ මා දැක හිනැහෙන්නේ**

**ගිය ඉරිදා ඉස්කෝලේ එන්න බැරි වුණේ**
**ලොකු අම්මා එක්කල මම නුවර ගියානේ**
**බොරුවක් නොව මේ මම ඇත්තයි පවසන්නේ**
**ඉතින් තවම ඇයි හිමි මා දැක හිනැහෙන්නේ**
**මා දැක හිනැහෙන්නේ**

**අමුතු හිනාවකි හිමි ඔබ මවෙත හෙලන්නේ**
**මා ගැන හොඳ හැටි දන්නා බවකි කියන්නේ**
**සමාවන්න හිමියනි බොරු නොකියමි හිතකින්**
**නෙලාගත්තෙ මේ මල නංගිගෙ මල් ගසකින්**

**දරුවන් වෙත දෙනෙත් හෙලා හිමි වැඩ ඉන්නේ**
**හොර බොරු කිසිදින නොකරනු මැනවි ළමයිනේ//**

ගේය පද : ප්‍රේමකීර්ති ද අල්විස්
තනුව : ආචාර්ය වික්ටර් රත්නායක
ගායනය : පේෂලා මෙන්ඩිස්

පුංචි දරුවෝ හැටියට අපි පුංචි පුංචි බොරු කියනවා. ඒ නොදන්නාකමට. අපි ටික ටික ලොකුවෙන විට එය දැනෙනවා. සති අන්තයේ දවසක අපේ ගෙදරට ලොකු අම්මලාත් අක්කලාත් එක්ක ආවා. ඒ නිසා මට දහම් පාසලට යන්න බැරිවුණා.

ඊළඟ සතියේ දහම් පාසලට ගිය මගේ පොතේ අප්පච්චි ලියලා තිබුනේ අසනීප හේතුවෙන් නොපැමිණි බව. ඒත් ඒක බොරුවක් බව මම දන්නවා. වැඩිහිටියන්ගේ වුවමනාවට පුංචි අපිට සමහර වෙලාවට බොරු කියන්න සිද්ධ වෙනවා.

ඔය අතර බැති ගී පුහුණුවීම් පටන් ගත්තා. සංගීත ගුරුතුමෙක් “මලක් නෙලා ගෙනැවිත් බුදු සාදුට පිදුවා” ගී පද පෙළ ලියාගන්නට දෙමින් පුහුණුවීම් කරන්න පටන් ගත්තා.

“ගිය ඉරිදා ඉස්කෝලේ එන්න බැරි උනේ

ලොකු අම්මා එක්කල මම නුවර ගියානේ....”

එතන හිටියේ මම නේද කියලා මට හිතුනා. මට පොඩි ලැජ්ජාවකුත් හිතුනා. පිළිමයක් උනත් උන්වහන්සේ ඉදිරිපිට බොරුවක් කළේ ඇයි දැයි මටම හිතුණා.

බුදුන් වහන්සේගේ හිනාව තුළ ඒ පුංචි බොරුවට සමාව දෙන්න පුළුවන්කමක් තිබුණාදැයි මට සැක හිතුණා.

බලන්න, අහන්න මේ ගීතයේ ඔයාවත් ඉන්නවද කියලා.

## සතුන්ගේ දරු සෙනෙහස...



**පින් සිදුවෙන්නේ අනේ බාල ළමුන්නේ**
**මගේ කුඩා නිවස කඩා බිම නොදමන්නේ**

**වනේ පුරා සොයා ගොසින් කෝටු කඩාලා**
**කුඩා කුඩා කැබලි තුඩින් මෙහි ගෙනැවිල්ලා**
**ගසේ මුදුන් අත්ත උඩින් කෝටු තබාලා**
**උදේ පටන් දවස පුරා කූඩු තනාලා**

**කොළේ කොළේ දමා කුඩා නිවස වසන්නේ**
**මගේ දයා බිරිඳ නිතර එය සරසන්නේ**
**රැලේ රැලේ පුළුන් දමා යහන සදන්නේ**
**අගේ මටයි ළදරුවනේ එය නොකඩන්නේ**

**දෙමාපියන් සෙනේ වෙතේ තම දරුවන්ටා**
**ළමා ඔබෙන් අපට නැතේ මිහිපිට ඉන්ටා**
**සමාවෙලා මෙඅප වෙතේ දිවි රැකගන්ටා**
**නමා යදිමි දෙන්න පුතේ මෙතැන රඳන්ටා**

ගේය පද : ආර්.එන්.එච්. පෙරේරා

තනුව හා ගායනය : සී.ටී. ප්‍රනාන්දු

පුංචි කුරුලු ජෝඩුවක් ලහි ලහියෙ අපේ නිවස අසල ගස් බෙනයක කූඩුවක් හදන්නට කෝටු කෑලි පුළුන් කැබලි චූටි හොටෙන් අරගෙන චිත් වෙහෙසෙන අපූරුව මම බලාගෙන හිටියා. ටික දවසක් ගතවුණා. බෙනය තුළින් හොට එළියට දාගත්තු පුංචි පැටව් දෙන්නෙක් මම දැක්කා. කුරුලු අම්මා ඔවුන්ට කෑම කවනවා. බලන් ඉන්න හරී ආසයි.

ඒත් ටික වෙලාවකදි ඒ අසලම අත්තක උකුස්සෙකු මේ පැටව් දෙන්නව කූඩුවෙන් එළියට ගන්න මාන බලමින් ඉන්නවා. කුරුළු මවත් කුරුළු පියත් පැටවුන්ව උකුස්සගෙන් බේරගන්න හරිම කලබලෙන් පුදුම උත්සාහයක් දරනවා. කෑගසමින් පියාඹනවා. අනේ අපට උදව් කරන්න කියන්නා වගේ.

අපේ අම්මා අප්පච්චි අපිව රැකගන්න මොන තරම් වෙහෙසක් ගන්නවද? අපිව අව්වෙන් වැස්සෙන් ආරක්ෂා කරලා ලස්සන නිවසක් තනලා කවලා පොවලා උස්මහත් වෙනකම් ලොකු කැප කිරීමක් අපි වෙනුවෙන් කරනවා.

සී.ටී. ප්‍රනාන්දු ගායකයානන් ගැයුවේ මේ ගැනම නේද?

අපේ මිතුරෝ සෙල්ලම් කරන ගමන් ගස් උඩ තියෙන කුරුලු කූඩුවක් දුටුවම ඒක ගල් ගහලා බිමට දානකම් ඉවසුම් නැතුව ඉන්න බව අපි දන්නවා. නොදන්නා කමට කලත් ඒක මොන තරම් පවක්ද?

මිනිසුන් වගේම සතුන්ටත් දරුවන්ට ඇති ආදරය එක වගේමයි. ඔයාලත් මේ ගීතය අහලා බලන්න ඔයාලගෙ හිතට මොනතරම් නම් සංවේදීව මේ ගීතය දැනෙයිද කියලා.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01